## <u>මයිකල් ජැක්සන් හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය</u>

මයිකල් ජැක්සන් මියගියේ ඉස්ලාම් භක්තිකයකු ලෙස ය. ඔහු සිය ජීවිතය අවසන් කාලයේ ක්‍රිස්තියානි ආගම අත්හැර ඉස්ලාම් ආගම වැළඳගෙන සිටි බවට සාක්ෂි වෙයි. එහෙත් ඔහුගේ අවසන් කටයුතු කෙරුණේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි පමණක් නොව ක්‍රිස්තියානි ආගමේ ද සිරිත් විරිත්වලට එකඟව ය. මයිකල් ජැක්සන් සෑම අතින් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දරුවෙක් විය. ආගම මාරුකිරීමෙන් පමණක් සංස්කෘතික ආධිපත්‍යයෙන් ගැලවිය නොහැකි බව ඔහු දැන නො සිටින්නට ඇත.

බටහිරයන්ට අනුව මයිකල් ජැක්සන් ජනප්‍රිය සංස්කෘතියේ විශිෂ්ටයෙකි. මෙරට ද ඇතැම්හු ඒ බව කියති. ඒ සමග තමන් ලංකාවට ජනප්‍රිය සංස්කෘතිය යන්න හඳුන්වාදුන් බව පවසන්නෝ ද වෙති. මෙරට උගතුන්ට කළ හැක්කේ බටහිර සංකල්පයක්, ප්‍රවාදයක් ලංකාවට හඳුන්වාදුන්නේ තමන් බව පැවසීමට පමණ ය. ඔවුන්ට තමන්ගේ ම සංකල්පයක්, ප්‍රවාදයක් නිර්මාණය කළහැකි නො වේ. මෙරට පමණක් නොව ආසියාවේ අප්‍රිකාවේ හා දකුණු අමෙරිකාවේ උගතුන්ගේ ඉරණම එය වෙයි. ඔවුහු හඳුන්වාදෙන්නෝ මිස බුද්ධිමත්තු නො වෙති. ජනාධිපති රාජපක්ෂ මහතා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් බලාපොරොත්තුවන දේශජ විසඳුම නම් මොවුන්ගෙන් නොලැබෙනු ඇත.

අප ජනප්‍රිය සංස්කෘතිය දකින්නේ කෙසේ ද? මෙහි දී අප යනුවෙන් අදහස් කරන්නේ කවුරුන්දැයි පළමුවෙන් සඳහන් කළ යුතු ය. සිංහල බෞද්ධ චින්තනය මත පදනම් වී දැනුම නිර්මාණය කරන්නන්ගෙන් හා එවැනි දැනුම් භාවිතා කරන්නවුන්ගෙන් යම් පිරිසක් අප යනුවෙන් හැඳින්වෙති.

ජනප්‍රිය සංස්කෘතිය යන සංකල්පය පමණක් නොව ඒ ප්‍රපංචය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නිර්මාණයකි. ඒ විශේෂයෙන් ම ඇමරිකානු නිෂ්පාදනයකි. බටහිර සමාජ විද්‍යාඥයන්ට අනුව ජනප්‍රිය සංස්කෘතිය යන්නට විවිධ අර්ථකථන ඇති නමුත් සාමාන්‍යයෙන් ඉන් අදහස් කෙරෙන්නේ සංගිතය, ආහාරපාන, ආකල්ප, ඇඳුම් පැලඳුම් ආදී වශයෙන් සියළු ක්ෂෙත්‍රවල ම පාහේ බොහෝ දෙනාගේ කැමැත්ත දිනාගත් අංගෝපාංගවලට ය. මෙය ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ අර්ථදැක්වීමක්, නිර්වචනයක් නොවුවත් ඉන් බොහෝ දේ කියැවෙයි.

ජනප්‍රිය සංස්කෘතිය බිහි කෙරී ඇත්තේ ජනමාධ්‍ය විසින් නොවුවත් ජනප්‍රිය සංස්කෘතිය ජනමාධ්‍යය හා බැඳී ඇත. ජනප්‍රිය සංස්කෘතියේ අංගෝපාංගවලට ප්‍රසිද්ධිය පමණක් නොව අවසානයේ දී අනුමැතිය ද ලැබෙන්නේ ජනමාධ්‍ය ඔස්සේ ය. මෙහි දී විශේෂයෙන් ම ඉලෙක්ට්‍රොනික ජනමාධ්‍යය ගැන කියැවෙයි. ඉලෙක්ට්‍රොනික ජනමාධ්‍යය ප්‍රචලිතවීම ඇරඹුණේ ඊනියා දෙවැනි ලොක යුද්ධය සමග වීමත් ඇමරිකානු ආධිපත්‍යය ද ඉලෙක්ට්‍රොනික කර්මාන්තය සමග බැඳී පැවතීමත් මෙහි දී වැදගත් වෙයි.

ජනප්‍රිය සංස්කෘතියේ අංගෝපාංග උසස් සංස්කෘතියේ අංගෝපාංගවලින් වෙනස් වෙයි. ඇතැම් පුද්ගලයන් ඒ සංස්කෘති දෙකේ ම අංගෝපාංගවලට කැමතිවීම නිසා එවැනි භේදයක් නැතැයි නොගත යුතු ය. බටහිර සම්භාව්‍ය සංගීතයට ප්‍රියකරන්නකු මයිකල් ජැක්සන්ගේ සංගීතයට ද ප්‍රියවිය හැකි ය. එහෙත් එපමණකින් මයිකල් ජැක්සන්ගේ සංගීතය බටහිර සම්භාව්‍ය සංගීතය යැයි වරදවා හිතන්නකු නැත. ඇතැම් පශ්චාත්නූතනවාදියකු (මෙරට නොව බටහිර, මෙරට අයට කළහැක්කේ හඳුන්වාදෙන්නන්ගේ කාර්යය පමණකි.) ජනප්‍රිය හා උසස් යනුවෙන් සංස්කෘතීන් දෙකක් නැතැයි තර්ක කරනු ඇත. එහෙත් මයිකල් ජැක්සන් හා මොසාට් එකම තලයක නොවන බව පැහැදිලි ය. එසේ වුවත් අවශ්‍ය නම් අයකුට ජැක්සන් මොසාට්ට වඩා දක්ෂ සංගීතඥයකු ලෙස හඳුනාගැනීමේ ඉඩකඩ ඉන් නො ඇහිරෙයි.

අප දකින ආකාරයට අනුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඇරඹී වසර පන්සියයක් පමණ වෙයි. ඒ චින්තන විප්ලවයක ප්‍රතිඵලයකි. අවුරුදු පන්සියයකට ඔබ්බෙන් බටහිර යුරෝපයේ පැවතියේ කතෝලික චින්තනයයි. බටහිර විශ්වවිද්‍යාල, බටහිර සම්භාව්‍ය සංගීතය ආදිය ඇරඹුණේ කතෝලික චින්තනයෙහි ය. එකල බටහිර යුරෝපයෙහි තිබුණේ පෞද්ගලිකත්වය සමස්තයෙහි ගිළුණු සමාජයකි. ඉහළ සමාජයෙහි සිටියවුන්ට සංස්කෘතියක් විය. අනෙක්

© Prof. Nalin De Silva

අයට බටහිර යුරෝපයට අනුව කිවයුතු තරම් සංස්කෘතියක් නො වීය. ලංකා විශ්වවිද්‍යාලයෙහි ද කලක් මෙයට සමීප සංකල්පයක් තිබුණි. සංස්කෘතියක් ඇත්තෝ කුල්ටෝ වූහ. නැත්තෝ හරමානිස්ලා වූහ. බටහිර සම්භාව්‍ය සංගීතය රසවින්දෝ ඉහළ සමාජයෙහි වූහ. විශ්වවිද්‍යාලවලට ගියෝ ද ඔවුහු ම වූහ.

එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් මේ සියල්ල වෙනසකරන ලදී. එහි පෞද්ගලිකත්වයට සාමූහිකත්වයට වඩා ඉහළ වටිනාකමක් විය. ඉන්ද්‍රිය පිනවීම සමාජයේ වැදගත් තැනක් ගත්තේ ය. කලින් සමස්තයෙහි ගිලී සිටි පුද්ගලයෝ සමස්තයට උඩින් වැජඹෙන්නට වූහ. ඒ අතර බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හිමි බෙදා වෙන්කිරීම හා සංස්ලේෂණය වෙනුවට විශ්ලේෂණය ඉස්මතු විය. මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ උසස් යැයි සම්මත සමාජයට හැරෙන්නට අනෙක් අයට ද සංස්කෘතියක් ඇතැයි පිළිගැනීම ය. මේ සංස්කෘතිය එක් කලෙක ගැමි සංස්කෘතිය යනුවෙන් හැඳින්විණි.

එහෙත් ගැමි සංස්කෘතිය යන්න සංකල්පීය වශයෙන් වුව ද නිවැරදි නො වේ. එකිනෙකාට හා ඉඩම්වලට බැඳී සිටි සාමාන්‍ය ජනතතාවගෙන් යම් කොටසක් සමස්තය යන්න හීනවී පෞද්ගලිකත්වය ඉස්මතු විමෙන් පසුව ඉඩම්වලින් ද එකිනෙකාගෙන් ද වෙන් වී ගම්බිම් අත්හැර නගරයට පැමිණියහ. ඔවුහු තවදුරටත් ගැමියෝ නො වූහ. මෙසේ පෞද්ගලිකත්වය ඉස්මතුවීම ඔස්සේ බිහිවුණු සාමාන්‍ය ජනකායකගේ සංස්කෘතිය අද වන විට ජනප්‍රිය සංස්කෘතිය ලෙස හැඳින්වෙයි. සංගීතය ආහාරපානවලට පමණක් නොව විශ්වවිද්‍යාලවලට ද මේ තත්වය බලපා ඇත. අද බටහිර රටවල විසිවැනි සියවසේ මුල තිබූ විශ්වවිද්‍යාල නොමැති බව බටහිර සමාජවිද්‍යාඥයන්ට ද තවමත් තේරුම් ගොස් නැත. පාඨමාලා ඒකක ක්‍රමය, සම්භාර (ක්‍රෙඩිට්), ආදිය විශ්වවිද්‍යාල ජනප්‍රිය සංස්කෘතිය විසින් ආක්‍රමණය කරනු ලැබීමේ ප්‍රතිඵල වෙයි. ජනප්‍රිය සංස්කෘතිය විසින් කෙරෙන එක් දෙයක් නම් තමන්ට ඇත්තට ම නොමැති අගයක් සමාජය විසින් සාමාන්‍ය පුද්ගලයන්ට දෙනු ලැබ ඇතැයි හැඟෙන්නට සැලැස්වීම ය. එහෙත් එය පුස්සක් බව උපාධිධාරීන් ද ඇතුළු බොහෝ දෙනාට නො තේරෙයි.

එහෙත් අප බොහෝ විට ජනප්‍රිය සංස්කෘතිය දකින්නේ සංගීතයෙහි හා ක්‍රීඩාවෙහි මිස ශාස්ත්‍රීය ලෝකයෙහි නොවේ. තාක්ෂණයේ වර්ධනයත් සමග මේ ජනපිය සංගීතය බොහෝ පුද්ගලයන් අතර පැතිර ගියේ ය. විශේෂයෙන් ම ඇමරිකාවේ කළු ජනවාර්ගිකයන්ට මේ සංගීතය ඔස්සේ මායාකාරී තැනක් සමාජයෙන් ලබාගත හැකිවිය. කල්ලෝ නැටූහ. ගැයූහ. ක්‍රීඩා කළහ. ඇතැම්විට මුදල් ද ඉපයූහ. එහෙත් ඔවුන්ට සමාජයේ බලයක් නැතිවිය. (ඔබාමා කල්ලකු වන්නේ පාටින් පමණකි).සමාජයේ තැනක් ලැබූ පුද්ගලයන් ලෙස  පෙනී සිටි කල්ලන් සමහරකුට මේ බව වැටහිණි. ඔවුන් ඉස්ලාම් ආගම වැළඳ ගත්තේ එයට ප්‍රතිචාරයක් ලෙස ය. මයිකල් ජැක්සන්ට පමණක් නොව මොහොමඩ් අලිට ද ඒ ඉරණම අයිතිවිණි. මයිකල් ජැක්සන්ගේ ඉරණම අලිගේ ඉරණමට ද වඩා ශෝකාකූල ය. ජැක්සන්ට අඩුම තරමින් තම නව ආගම අනුව අවමංගල කටයුතුවත් කරගැනීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඉඩ නො දුන්නේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva